ගෝමරන්කඩවල ප්‍රාදේශීය සභාව
---------------------------------------
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
-----------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

----------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

-----------------------------------

2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 ජූලි 12 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 දෙසැම්බර් 03 දින ද මාස 04 ක ප්‍රමාදයකින් පසුව විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබූ අතර, 2015 වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2016 නොවැම්බර් 22 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

1.2 **තත්ත්වාගණනය කළ මතය**

-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට ගෝමරන්කඩවල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

------------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

-------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) රාජ්‍ය පරිපාලන , පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශයේ 2015 ජූලි 27 දිනැති ලිපිය ප්‍රකාරව 2015 වර්ෂයේ සභාව වෙත ලැබුණු මෝටර් ග්‍රේඩර් රථය, ඩම්ප් ට්‍රක් රථය, කෘ කැබ් රථයන්හි මුළු වටිනාකම රු.34,170,550 ක් වුවත් එම රථවල වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුල රු.7,300,000 ක් ලෙස දක්වා තිබීමෙන් මෝටර් රථවල වටිනාකම රු. 26,870,550 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) 2015 වර්ෂයට අදාල හිඟ හිටි වෙළඳ බලපත්‍ර ගාස්තු රු. 27,350 ක් ගිණුමවලට ගෙන නොතිබුණි.

(ඇ) 2015 වර්ෂයේ දී ලද උසාවි දඩ මුදල වූ රු. 1,363,867 ක් වර්ෂයේ ආදායමට ගෙන නොතිබුණි.

1.3.2 **නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම්.**

-----------------------------------------------

තැන්පත් කර වසර 02 ක කාලයක් ඉක්ම වූ රු. 16,400 ක් වන තැන්පතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 අනුව කටයුතු කර නොතිබුණි.

2. **මූල්‍ය සමාලෝචනය**

-----------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵලය**

----------------

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.957,810 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,613,663 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,571,473 ක අවාසිදායක විචලනයක් නිරීක්ෂණය විය.

2.2 **ආදායම් පරිපාලනය**

**2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යය සාධනය**

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු..000 | රු.000 | රු.000 |
| බදු කුලී | 1,079 | 764 | 189 |
| බලපත්‍ර ගාස්තු | 61 | 67 | 27 |
| වෙනත් ආදායම් | 2,708 | 3,083 | 1,641 |

2.2.2 **මුද්දර ගාස්තු**

2015 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන ලේකම්වරයාගෙන් ලැබිය යුතු මුද්දර ගාස්තුව ගණනය කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 **උසාවි දඩ**

2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වශයෙන් ලැබිය යුතු මුදල් හඳුනා ගැනීමට සහ ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

2015 ජූලි 14 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 04/2015 අනුව මෝටර් රථ සඳහා රක්ෂණාවරණ ලබා ගැනීමේ දී රජය සතු ආයතන වෙතින් සෘජුවම ලබාගත යුතු වුවත් සභාව විසින් රක්ෂණ නියෝජිතයෙකුගේ මාර්ගයෙන් වාහන 04 ක් සඳහා රක්ෂණාවරණ ලබාගෙන තිබුණි.

3.2 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයෙන් ග්‍රාමීය ජනතාව සවිබල ගැන්වීමේ අරමුණින් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය මගින් ක්‍රියාත්මක කරනු ලබන “ ඉ නැණසල ” ව්‍යාපෘතිය ගෝමරන්කඩවල මහජන පුස්තකාලයේ 2014 නොවැම්බර් මස 18 වන දින ආරම්භ කර පරිගණක , මුද්‍රන යන්ත්‍ර , ස්කෑනර්, වෙබ් කැමරා යනාදි උපකරණ ලබා දී තිබුණ ද එමගින් අපේක්ෂිත ප්‍රතිලාභ ජනතාවට ලබා දීමට 2016 අගෝස්තු 31 දින වන විටද කටයුතු කර නොතිබුණි

3.3 **කොන්ත්‍රාත් පරිපාලනය**

3.3.1 **ගෝමරන්කඩවල පානීය ජල ව්‍යාපෘතිය**

සභා බල ප්‍රදේශය තුල බීමට සුදුසු පානීය ජලය නොමැති වීමේ ගැටළුවට විසඳුමක් වශයෙන් පුර නැගුම ව්‍යාපෘතිය යටතේ පානීය ජල ව්‍යාපෘතියක් අදියර තුනක් යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා සභාව විසින් රු. 51,571,930 ක් වටිනා ගිවිසුම් තුනක් 2013 අගෝස්තු , දෙසැම්බර් සහ 2014 මැයි මැයි මාසයේ සිට අත්සන් කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉංජිනේරු පිරිවිතරවලට අනුව මිනිත්තුවකට ලීටර 300 ක ධාරිතාවයකින් යුතු වතුර මෝටරයක් සවි කිරීමට සැළසුම් කර තිබුණද , කොන්ත්‍රාත්කරු සවිකර තිබුණේ මිනිත්තුවකට ජල ලීටර 100 ක ධාරිතාවයකින් යුත් මෝටරයක් බව 2016 අගෝස්තු 25 දින කරනන ලද භෞතික පරික්ෂාවේදී ආණාවරණය විය.

(ආ) ධාරිතාවය ලීටර් 300 ක මෝටරය සඳහා රු. 175,000 ක් ගෙවිය යුතුව තිබුණද වැඩ විෂය අංක 5.1 ට අනුව මිනිත්තුවකට ලීටර 100 ක ධාරිතාවයකින් යුත් මෝටරයක් සඳහා රු. 200,000 ක මුදලක් ගෙවීම් කර තිබුණි. ඒ අනුව අඩු ධාරිතාවයෙන් යුත් මෝටරයක් සඳහා වැඩි මුදලක් ගෙවීම් කර තිබුණි.

(ඇ) ඉහත කී පරිදි ධාරිතාවය මිනිත්තුවට ලීටර 100 ක් වන මෝටරයක් සවි කිරීම නිසා ජල ටැංකිය පිරවීම සඳහා වැඩිපුර කාලය ගතවීමෙන් අමතර විදුලි බලයක් යෙදවීමට සිදුව තිබුණි.

(ඈ) මෙම ව්‍යාපෘතියෙහි අරමුණ වූයේ ගෝමරන්කඩවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ගෝමරන්කඩවල හා කන්දමාලාව ග්‍රාමසේවා වසම් දෙකෙහි පදිංචි පවුල් 685 කට සෞඛ්‍යාරක්ෂිත පානීය ජලය ලබාදීමයි. නමුත් ඉදිකරන ලද ළිදෙහි ජලය දුඹුරු පැහැ ගැන්වී තිබීමත් ජලය පිරිපහදු කිරීමේ ක්‍රමවේදයක් ඇතුලත් කර නොතිබීමත් නිසා එහි ජලය බීමට නුසුදුසු තත්වයේ පැවතිණි.

(ඉ) ළිදෙහි ජලය ප්‍රමාණවත් නොවීම හා සෞඛ්‍යාරක්ෂිත නොවීම හේතුවෙන් ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ උපදෙස් පරිදි මෙම ජල ව්‍යාපෘතිය පියවර iv ලෙස නල ළිදක් ඉදිකිරීම වෙනුවෙන් 2016 ජනවාරි 27 වන දින රු. 6,986,000 ක් වටිනා කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණි.

(ඊ) මෙම ව්‍යාපෘතියේ අධීක්ෂණ හා උපදේශණ කටයුතු සිදු කිරීම වෙනුවෙන් ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය සමඟ 2013 මැයි 13 වන දින ගිවිසුම් අත්සන් කර තිබූ අතර, මේ වෙනුවෙන් රු. 2,623,200 ක මුදලක් ගෙවා තිබුණි. නමුත් නිසි පරිදි ශක්‍යතා අධ්‍යනයක් සිදු නොකර ළිඳ ඉදිකිරීමත් එම ළිඳ පිහිටි ස්ථානයේ සිට කිලෝමීටර 1 1/2 ක් පමණ දුරින් පිහිටි ස්ථානයක ටැංකිය ඉදිකිරීමත්, නිසා අපේක්ෂිත පවුල් වෙත නිසි පරිදි ජලය ලබා දීමට නොහැකි වී තිබුණි.

(උ) රු. 28,943,737 ක මුදලක් වැය කොට පවුල් 475 සඳහා බට ඇතිරීම සිදු කොට තිබුණු නමුත් තිරප්පනේ, මඩුගහවැව, කරක්ගහ වැව හා රීදීපුර යන ගම්මානවල පදිංචි පවුල් 150 කට ජල සැපයුම් ආරම්භ කල 2014 වර්ෂයේ සිටම ජලය ලබාදීමට නොහැකි වී තිබිණි.

**3.3.2 ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල ඉදිකිරීම**

---------------------------------------------

පුරනැගුම ව්‍යාපෘතිය යටතේ ප්‍රාදේශීය සභාවේ කාර්යාලය සඳහා දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට රු. 31,600,000 වටිනාකමකට මාස 06 ක කාලයක් තුල ඉදිකිරීම් අවසන් කිරීමේ පදනම මත 2012 දෙසැම්බර් 13 දින කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කර තිබුණු අතර, 2014 අගෝස්තු 18 වන දින ගොඩනැගිල්ල සභාවට භාර දී තිබුණි.

මේ සම්බන්ධයෙන් 2016 අගෝස්තු 25 දින කරන ලද ස්ථානීය පරික්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) ගොඩනැගිල්ලේ උඩු මහලයේ පිහිටි රැස්වීම් ශාලාව, ලේඛනගාරය, මහජන ගැලරිය යන ස්ථානවලට වැසි ජලය සිවිලම තුලින් ගලා ඒම හේතුවෙන් එම ශාලා සහ ලේඛනාගාරය තුල තිබූ ඡායා පිටපත් යන්ත්‍රය හා පරිඝනක යන්ත්‍ර ජලයට තෙමීම නිසා භාවිතයට ගත නොහැකි වී තිබුණි. ගොඩනැගිල්ලේ වහලය සකස් කිරීමේ ඉංජිනේරු නිර්මාණ සැලැස්මේ තිබූ අඩුපාඩු හේතුවෙන් වහලය වෙනුවෙන් ගෙවා තිබූ රු. 2,113,650 ක මුදල නිෂ්කාර්ය වියදමක් බවට පත් වී තිබුණි.

(ආ) 2005 අංක 03 දරන මුදල් පනතේ III කොටසේ ප්‍රකාර (2007 අංක 13 හා 2009 අංක 18 දරන මුදල් සංශෝධන පනත්වලින් සංශෝධිත) කොන්ත්‍රාත්කරුට ගෙවා තිබූ රු. 36,851,944 ට අදාල කර්මාන්ත සහතික අරමුදල් බදු (CIGFL) වන රු. 92,130 ක් රඳවා ගෙන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට යැවීමට කටයුතු කර නොතිබුණි.

3.3.3 **ගෝමරන්කඩවල සතිපොල කඩකාමර ඉදිකිරීම**

-----------------------------------------------------

සභාව විසින් පුරනැගුම ව්‍යාපෘතිය යටතේ ගෝමරන්කඩවල සතිපොල කඩකාමර 03 ක් ඉදිකිරීම වෙනුවෙන් රු. 4,201,675 ක (එකතු කළ අගය මත බදු රහිත) වටිනාකමකට 2011 ඔක්තෝම්බර් 17 දින කොන්ත්‍රාත්කරු සමග ගිවිසුම් අත්සන් කර තිබිණි.
මේ සම්බන්ධයෙන් 2016 අගෝස්තු 03 දින කරන ලද ස්ථානීය පරික්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් රු. 4,577,733 ක මුදලක් ගෙවා තිබූ අතර, ඉදිකිරීම් සම්පූර්ණ කර 2012 මාර්තු 15 වන දින සභාව වෙත භාර දී තිබුණි. මෙහි වහලය සෙවිලි තහඩු යොදා සකස් කර තිබුණද, එය නිසි ප්‍රමිතියට අනුව සකස් කර නොතිබීම හේතුවෙන් තහඩු තුලින් ජලය කාමර තුලට ගලා ඒමෙන් කඩකාමර භාවිතයට ගත නොහැකි වීම නිසා එහි වහලය නැවත සකස් කිරීමේ අරමුණින් 2016 අගෝස්තු 31 දින වන විට සම්පූර්ණයෙන් ඉවත් කර තිබුණි.

(ආ) වහලය ඉදිකර වසර 04 ක් වැනි කෙටි කාලයක් තුල නැවත සකස් කිරීම වෙනුවෙන් රු. 242,907 ක ඇස්තමේන්තුවක් සකස් කොට තිබුණි. නිසි අධීක්ෂණයකින් තොරව ඉදිකිරීම් සිදුකිරීම හේතුවෙන් නැවත දැරීමට සිදුවන වියදම් අමතර වියදම් බවට පත් වී තිබුණි.

3.3.4 **ව්‍යාපෘති ප්‍රමාද කිරීම**

------------------------

ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන යටතේ මැදවච්චිය ග්‍රාමයේ ඇති ප්‍රාදේශීය සභා කඩ කාමර අළුත්වැඩියා කිරීම වෙනුවෙන් පියවර I හා II වශයෙන් පිළිවෙලින් රු. 498,422 ක් හා රු. 302,868 ක් වටිනා ගිවිසුම් දෙකක් 2015 නොවැම්බර් 12 වන දින සභාව විසින් ප්‍රජා මණ්ඩලයක් සමග අත්සන් කොට තිබුණද, 2016 අගෝස්තු 31 දින වන විටද එහි වැඩ කටයුතු ආරම්භ කර නොතිබුණි.

3.4 **පාරිසරික බලපත්‍ර**

--------------------

1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 "අ" වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පරිසර බලපත්‍ර ලබාගත යුතු සභා බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක වන වඩු කර්මාන්ත, වී ඇඹරුම්හල් හා ගල් වැඩපල යන ව්‍යාපාර පිළිබද විධිමත් සමීක්ෂණයක් මගින් හදුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම සභාව මගින් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගත යුතු ව්‍යාපාරවලට එම බලපත්‍ර නිකුත් නොකර වෙළඳ බලපත්‍ර නිකුත් කර තිබුණි.

4. **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

------------------------------------------

4.1 **අයවැය පාලනය**

--------------------

සමාලෝචිත වර්ෂයේ තත්‍ය වියදම සහ අයවැය ප්‍රතිපාදන සියයට 18 සිට සියයට 73 දක්වා වූ පරාසයක විචලනයක් පැවතුණි. ඒ අනුව වාර්ෂික අයවැය විධිමත් මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

4.2 **වත්කම් කළමනාකරණය**

------------------------------

(අ) **නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්**

--------------------------------------------

2015 වර්ෂයේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන යටතේ සභා ට්‍රැක්ටර් රථ සඳහා සුදු යකඩ ජල ටැංකි 02 ක් රු. 1.000,000 ක වටිනාකමකට මිලට ගෙන තිබූ නමුත් 2016 අගෝස්තු 31 දින වන විටද ඒවා නිෂ්කාර්යව පැවතුණි.

(ආ) **භාණ්ඩ සමීක්ෂණය**

----------------------

2015 වර්ෂයට අදාලව 2016 මාර්තු 05 වන දින පැවැත් වූ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව සමීක්ෂණ මණ්ඩලය විසින් හඳුනා ගන්නා ලද අළුත්වැඩියා කලයුතු, විකිණිය යුතු හා විනාශ කල යුතු භාණ්ඩ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට 2016 අගෝස්තු 31 දින වන විටද කටයුතු කර නොතිබුණි.

5. **මානව සම්පත් කළමනාකරණය**

---------------------------------

**අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

----------------------------------

2015 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| විධායක මට්ටම | 01 | - | 01 |
| ද්විතික මට්ටම | 15 | 09 | 06 |
| තෘතීය මට්ටම | 16 | 16 | - |
| එකතුව | 32 | 25 | 07 |

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 1996 වර්ෂයේ සිට පුරප්පාඩුව පවතින ප්‍රාදේශීය සභාවේ ලේකම් තනතුරෙහි කාර්යභාර්ය වැඩ බලන පදනම මත ඉටුකරන අතර 2016 අගෝස්තු 31 දින දක්වා පුරප්පාඩුව පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සංවර්ධන නිලධාරී, යන්ත්‍ර ක්‍රියාකරු සහ වැඩ පරීක්ෂක තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි.

6. **පද්ධති හා පාලන**

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

| | පද්ධතිය | අවධානය යොමු කල යුතු ක්ෂේත්‍රය |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | I. වත්කම් ගිණුම්ගත කිරීම<br>II. ආදායම් ගිණුම්ගත කිරීම |
| (ආ) | ආදායම් පරිපාලනය | හිඟ ආදායම් අය කිරීම |
| (ඇ) | කොන්ත්‍රාත් පරිපාලනය | I. කොන්ත්‍රාත් ඇගයීම් කිරීම<br>II. කොන්ත්‍රාත් ප්‍රමාදයකින් තොරව නිම කිරීම<br>III. කර්මාන්ත සහතික අරමුදල් බඳු ගෙවීම. |
| (ඈ) | මානව සම්පත් කළමනාකරණය | සේවක පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීම. |
| (ඉ) | අයවැය පාලනය | නිවැරදිව පිළියෙල කිරීම |